# පැරණි බෞද්ධ කලාවේ පාරිසරික චින්තනය

ආර්. පී. බී. ජයවර්ධන

සාහිත්‍ය කලාව දර්ශනය ආදී විෂයයෝ කාලීන වශයෙන් ඒවා බිහි වූ යුග තුළ පැවැති පොදු ජන චින්තනයේ ස්වරූපය නිරූපණය කරති. මෙවැනි විෂයන් මිනිස් චින්තනය හැසිරවීමට ඉවහල් වූවාක් මෙන් ම මිනිස් චින්තනය මෙම විෂයන්ගේ බිහිවීමට ද ඉවහල් විය. විශේෂ බුද්ධිය හා ආකල්ප වර්ධනය කිරීමෙහිලා කලාවෙන් ලැබිය හැකි පිටුවහල ඉමහත් ය. එයින් ගොඩනැඟිය හැකි ආකල්ප විවිධ ය. පෙරදිග කලා ශිල්පීහු මේ බව හොඳින් දැන සිටියහ. පෙරදිග චින්තනය සකස් කිරීමෙහි ලා චිත්‍ර හා මූර්ති කලාව ප්‍රායෝගික මාධ්‍යයක් හැටියට යොදා ගනු ලැබීය. ආගමික කලාකෘති වශයෙන් ආරම්භ වූ මේ නිර්මාණ අතර බෞද්ධ කලාවේ නිරූපිත පාරිසරික චින්තනය පරීක්ෂා කිරීම මෙම ලිපියෙහි මූලික අරමුණ ය.

සාංචි, බුද්ධගයා, භාර්හුත්, මථුරා, ගන්ධාර, අමරාවතී යන ස්ථානවල දක්නට ලැබෙන මූර්ති කලාවේ සෑම නිරූපණයක් ම පැරණි බෞද්ධයින් තුළ පැවැති ස්වභාව ධර්මය පිළිබඳ සෞන්දර්යාත්මක හැඟීම් සහ සංවේදනාව, භක්තිය හා අභිප්‍රසන්නත්වය මිශ්‍ර චින්තනයක් ප්‍රකාශ කරයි. පරිසරය හා ආගම ධර්මය අතර ගැඹුරු චින්තනයක් දක්වන මේ කලා කෘති එක් පැත්තකින් කාලීන වශයෙන් එක්තරා චින්තනයක් ගොඩනැඟීමට උපයෝගී කරගත් බව සිතිය හැක. මෞර්ය සභ්‍යත්වයේ උදාවත් සමඟ බෞද්ධ කලාව ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවිණි. ඉන්පසු කලා විෂය බුදු දහම පැතිර ගිය සෑම රටවල ආකල්ප පෝෂණය සඳහා යොදා ගත් ප්‍රබල මාධ්‍යයක් විය.

මෞර්ය ශිෂ්ටාචාරයේ කලා කෘති මෞර්ය - ශුංග යන යුග දෙකට අයත් වේ. මෙකල බිහි වූ නිර්මාණ පොදු ජනයා තුළ එක් චින්තනයක් ඇති කිරීමට ගත් උපාය මාර්ගයක් හා අත්හදා බැලීමක් හැටියට හඳුන්වා දිය හැක. සදාචාරාත්මක ආකල්ප බිහි කිරීමට ආලෝක රශ්මි පිහිටුවන ලද